උඩහකඩේ විවිධ සේවා ආයතනයකි. අපේ ගෙට උඩින් අපේ ගේ පැත්තේ ම උඩහකඩේ පිහිටා තිබිණ. එය කඩ උළුවහු තුනකින් සමන්විත ලොකු ගෙයකි. ලිහිනිස් මුදලාලි මහතා එහි අයිතිකරු ය.

"අවසරලත් රබර් වෙළඳ තැන" එහි එක් සේවාවකි. පළාතේ ම වැඩිපුර රබර් මිලට ගැනීම සිදු වන්නේ උඩහකඩයේ යයි කීවොත් එය මුසාවක් නොවේ යයි

# උඩහ කඩේ

සිතමි. එයට විශේෂ හේතුවක් තිබේ. රබර් රොටි (ෂීට්) තුනී කර "ඩයමන්ඩ්'' ගසන මැෂින් දෙකක් පිළිකන්න පැත්තේ වෙනම ගොඩනැගිල්ලක ඇත. එකක් දිය රෝල ය. අනෙක ඩයමන්ඩ් රෝල ය. දිය රෝලෙන් තුනී කරන රබර් ෂීට් ඩයමන්ඩ් රෝල අතරින් යැවූ විට ෂීට් එක පුරාම ඩයමන්ඩ් ලකුණු මුද්‍රණය වේ. ඩයමන්ඩ් කරන්නට කලින් සමහර රොටිවල සීල් එක ගසනු ලැබේ. මුලු පළාතේ ම බොහෝ කුඩා රබර් වතු හිමියන් රබර්රොටි ඩයමන්ඩ් ගැසීමට එන්නේ මෙතැනට ය. බොහෝ වේලාවල දී රොටි තුනී කර ඩයමන්ඩ් ගසා ගන්නේ ද තමන් ම ය.

රබර් මිල දී ගැනීම කෙරෙන්නේ ඉස්සරහ එක් පැත්තක ය. කෙනෙක් වියළන රබර් රොටි කීපයක් රැගෙන කඩයට එන අන්දම ද, එය උඩට උස්සා හිරු එළියට අල්ලා දෙපැත්ත බලා මිල දී ගන්නා මුදලාලි හෝ රොබෝ සිංඤෝ මාමා නිතරම අපේ දෙනුවන් ගැටෙයි. ඔට්ටුපාළු මිල දී ගැනීම ද එලෙසින් ම කෙරෙයි. ඔට්ටුපාළු යනු රබර් කිරි කැපීමේ දී ගහේ කැපුම දිගේ මිදී ඇති රබර් පටිය සහ පොල්කටුවල ඉතිරි වී මිදී ඇති රබර් කිරි ය. වියළුණු රබර් රොටි වලට වඩා ඔට්ටුපාළු මිල අඩු ය. රබර් කිරා බැලීමට රතුපාට බිම්තරාදියක් ඇත. සමහර විටෙක අප ද අපගේ බර එම තරාදියෙන් කිරවා ගන්නෙමු. අප බර කිරවා ගන්නා විට තරාදියට නැග නැගිට සිටීම තහනම් ය. තරාදියට නැග ඒ මත වාඩි විය යුතු ය. එසේ කරන්නේ හම්බු කරගෙන කන වස්තුවකට ගෞරව වශයෙන් සලකා ය.

ඊ ළඟ කඩයේ හාල් සිල්ලර බඩු ය. කාමර වෙන් කරන ලද ලොකු බක්කියක් ද එහි ඇත. නිවසට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සියල්ලක් ම වාගේ එම කඩයේ තිබේ. හාල්, තුනපහ, වළං, පිඟන්, කොසු ඉදල්, ආදී සෑම දෙයක් ම එකම වහල යටින් ගත හැකි ය. සීනි ගෝනි දෙකකි. එකක් රතු සීනි ය. අනෙක සුදු සීනි ය. මෙම සීනි ගෝනි වටා සැරිසරණ මී මැස්සෝ ගී ගයති. හාල්, ලූනු, සක්කර, මුංඇට, පරිප්පු ආදිය කට රෝල් කළ ගෝනි වල ඇත. පැත්තක තැබූ පුන්නක්කු ගෝනියෙන් වැඩිපුර ම පුන්නක්කු රැගෙන යන්නේ බඩු අදින කරත්තයක හිමිකරුවකු වූ වෙලේ පොඩ්ඩ ආතා බව අප බොහෝ විට දැක තිබේ. උඩහකඩේට ඉහළින් මාටින් බාප්පලෑ ගෙය අසල සිට පහළකඩේ හරියට එනතුරු වෙලේ පොඩ්ඩ ආතාගේ කරත්තයේ පල්ලම් පොල්ල තද කරගෙන ඒම සිරිතකි. පල්ලම් පොල්ල යනු බඩු පුරවා ගත් කරත්තය පල්ලමේ බහින විට, කබරයාට වඩා වේගයෙන් කරත්තය ඉස්සර වෙන්නට දඟලන නිසා,අවශ්‍ය විටක රෝද දෙක තද කිරීමට හෝ බුරුල් කිරීමට හැකි අන්දමට සාදා ඇති උපකරණයකි. ඉතා අමාරුවෙන් උඩහ කඩය අසල කරත්තය නවත්වා ගන්නා පොඩ්ඩආතා පුන්නක්කු රැගෙන යාම සඳහා කඩයට යයි.

උඩහ කඩයේ සන්ලයිට් සබන්, බාගේ - කාලේ කෑලි වලට කැපීම සඳහා, බිත්තියේ ගැසූ ඇණයක ශක්තිමත් නූලක් එල්ලා ඇත. එම නූල සබන්කෑල්ල වටා ඔතා ඇදීමෙන් එය කැපිය හැකි ය. සන්ලයිට් සබන් බාගය, කාල, අරික්කාල වශයෙන් විකුණනු ලැබේ. වැඩිපුරම විකිණෙන සබන් වගීය ද සන්ලයිට් ය. එයට හේතුව එවකට ඇගේ ගෑමට ද වැඩි වශයෙන් භාවිතා කරන්නේ ද සන්ලයිට් සබන් වගීය වීම ය. අල, රටලූනු, රතුලූනු, සහ කරවල වගී ද බක්කි වල තිබේ. පොල්පළා, රණවරා ආදී නොයෙකුත් පැකට් වගී එල්ලූ බෝඩ් හැම තැන ම ඇත. ප්‍රචාරක දැන්වීම් සෑම බිත්තියක ම, දොරලෑල්ලක ම දැකිය හැකි ය. එවකට රතුලූනු කඩයට ගෙන ආවේ දිග "පැස්" නමැති භාජන වල ය. අඟල් පහක් පමණ විෂ්කම්භය ඇති අඩි දෙකක් පමණ උස ඇති, ඉදිකොළවලින් වියන ලද පැස්වල රතු ලූනු පුරවා ඇත. ඒවායේ ලූනු කඩ බක්කියට දැමූ පසු හිස් වන පැස් අපේ ඉඩමට ද විසිකොට තිබේ. එම හිස් පැස් සපත්තු මේස් ලෙස කකුල් වල දමාගෙන ඇවිදීම පුංචි අපගේ විනෝදාංශයකි. මගේ මතකයේ හැටියට එවකට පළාතට තිබුණු හාල් කූපන් කඩය උඩහකඩය යි. එවකට හාල් ලැබුණේ කූපන් වලට ය. අඟල් පහක් පමණ උස අඟල් හතක් පමණ පළල ප්‍රමාණයේ දෙකට නැමූ කවරයකට

කලාශූරී සනත් පියසේනයන් විසින් ලියන ලද'' පොඩි කොලුවයි ගමයි ගඟයි'' ග්‍රන්ථය ශ්‍රී ලංකා අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මගින් පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කර ඇත.මේ පොත තැපැල් මගින් ලබා ගැනීමට පහත ලිපිනයෙන් විමසන්න.

සනත් පියසේන
නොඃ33 ජර්මන් හිත මිතු ගම මාකන්දන- -මඩපාත-ශ්‍රී ලංකාව
RES: 94-1-2702899
MO: 0776434146

මැදිකොට හාල් කූපන් තිබේ. එම කූපන් පොත්, එක එක වගීයේ ය. පොත්වල වණීයේ එකිනෙක වගීයට තරමක වෙනසක් ඇත. කූපන්වල කූපනයේ තරාතිරම මුද්‍රණය කොට තිබේ. කම්කරු, සාමාන්‍ය, ළමයා, ළදරුවා යනුවෙන් තිබුණා මට මතක ය. තරාතිරමට අනුව මුදලට හාල් ලැබුණි. හාල් සේරුවක මිල ශත පහළොවක් පමණ වූ අතර, එවකට හාල් දුන්නේ තරාදියෙන් කිරා නොවේ. සේරුවකින් මැනීමෙනි. සේරුවක ප්‍රමාණය දැනට ඇති කිලෝ එකක ප්‍රමාණයට තරමක් සමාන යයි මට සිතේ. කිරි පිටි තිබුණේ ටිංවල සහ බෝතල්වල අසුරා ය. එවකට කඩදාසි පැකට් වල කිරිපිටි තිබුණේ නැත. වැඩි වශයෙන් තිබුණේ " කව්ඩන්ගේට්" යනුවෙන් ගමේ අය බැහැවර කළ "කව් ඇන්ඩ් ගේට්" සහ "ලැක්ටජන්" නම් කිරිපිටි වර්ගයන් ය. ඒවා මිල දී ගත්තේ පොඩි ළමයින් සඳහා ය. හෝර්ලික්ස් සහ නෙස්ටමෝල්ට් ද තිබුණි. පිටි රාත්තලක බඳුනක් සත අසූ ගණනක් හෝ අනූ ගණනක් ය. කෙසේ හෝ රුපියලකට අඩු ය. වෙනත් බොන පිටි වගී ගැන මට මතක නැත. මෙම කඩයේ ජයරත්න කියා කෙනෙකු ද බණ්ඩාර උන්නැහේ ද සේවය කළා මතක ය.

බණ්ඩාර උන්නැහේ ඉතා කරුණාවන්ත බොහෝ ම හොඳ ගුණ යහපත් කෙනෙකි. කඩයට පැමිණෙන සැමට ම ඉතා කරුණාවෙන් ආමන්ත්‍රණය කළ අයුරු, බිල් දැමූ අයුරු බඩු කිරා දුන් අයුරු මතක ය. එම කඩයේ ම අපේ ගේ පැත්තට වෙන්න මුල්ලේ ම වෙන්කළ කොටස කෂාය බඩු විකුණන තැන ය. එක එක රාක්ක සහ ලාච්චුවල කෂාය බඩු තිබුණේ ය. පත්පාඩගම් සහ කටුවැල්බටු තිබුණේ ගෝනි වල ය. කටුවැල්බටු, පත්පාඩගම් සහ කොත්තමල්ලි නිතරම වැඩිපුර විකිණෙන බෙහෙත් බඩු වශයෙන් මගේ මතකය කියයි. හෙම්බිරිස්සාඋණට වැඩිපුර පාවිච්චි කළේ කොත්තමල්ලි පත්පාඩගම් තැම්බූ වතුර ය. ඒපීසී යන නමින් රෝස පාට පෙති වගයක් ද තිබුණි. එහි පැකැට්ටුවේ ඩසබප්ැබඒ.'ජක යනුවෙන් මුද්‍රණය කොට තිබුණි. මෙම බෙහෙත පාවිච්චි කළේ ද උණට ය.

*ඔහු උපහාසයට මෙන් නිතර කියන කියුමක් වන "කාපන් බීපන් - පිඟාන ගෙනියන්න එපා" යන වදන අපට එදා නො වැටහුණත් එය කොතරම් හරයක් ඇති වචනයක් දැයි සිතෙන්නේ දැන් ය.*

මෙම බෙහෙත් බඩු කඩයට බෙහෙත් කිරා ගැනීම සඳහා වැඩි දෙනෙකු එන්නේ බෙහෙත් බඩු රැගෙන ය. ගමෙන් ගොඩෙන් සොයා ගැනීමට හැකි හැම දෙයක් ම අරගෙන විත් අවශ්‍ය අඩු දෙයක් පමණක් කඩයෙන් දමා කසාය කිරවා ගනිති. සමහරක් දාට කඩයෙන් කිසිවක් දැමිය යුතු නො වූවත් ඒවා කිරා දීමට කඩේ අය නිතර ම සැදී පැහැදී සිටිය හ. එය කඩයේ යුතු කමක් සේ සැලකුවා විය හැකි ය. කසාය කිරවා ගන්නවාට සල්ලි අය කරන්නේ නැත. කසාය කිරුවේ කළං ගණනට ය. කළඳක බර සඳහා ඝනකම ඇති තඹ සතයේ කාසියක් සහ මදටියා ඇට හතරක් තරාදියට දමයි.

අපේ ආච්චි ද බොහෝ බෙහෙත් වර්ග දන්නා බවලතෙකි. බොහෝ පොඩිපොඩි අසනීප වලට සුදුසු කසාය සීට්ටු ආච්චිගේ මතකයේ තිබේ. මොකක් හෝ අසනීපයක් කිවහොත් අහවල් ගහේ මුල්, අහවල් ගහේ කොළ, අහවල් ගහේ මල් අරගෙන කසාය හදන හැටි, මැල්ලුම් මලවන හැටි, වණ්ඩුවේ තම්බන හැටි, අනුපානයට ගන්නා දේ ආදිය පිළිබඳව ආච්චි සතුව ඇති දැනුම විශ්මයජනක ය. ලේබල් ගැසූ ගුළි වර්ග, බෙහෙත් තෙල් වර්ග ආදිය දැමූ කුප්පිපොඩි රාශියක් අපේ ගෙදර රාක්කයේ ද ඇත. සිද්ධාර්ථ තෙලත්, සීතාරාම ගුළියත් වරදින්නේ ම නැත. ආච්චි වෙදහාමිනේ කෙනෙකු නො වූවත් ඒ ගැන තිබුණු හැකියාව අත් දැකීමෙන් ලැබුණු දැනුම නිසා විය හැකි ය. බොහෝ විට ආච්චි උඩහ කඩයෙන් බෙහෙත් කිරවා ගන්නේ බෙහෙත් බඩු අරගෙන ගිහින් ම ය.

උඩහ කඩේ ලිහිනිස් මුදලාලි ගේ හාමිනේ ඉස්කෝලේ හාමිනේ ය. ඉහළ කරන්නාගොඩ දහම් පාසලේ දී ඈ අපට ද පාඩම් කියා දුන්නාය.

උඩහ කඩේ වත්තේ ලොකු ළිඳක් තිබේ. ඒ ළිඳ හඳුන්වන්නේ ඌරුළිඳ කියා ය. ගැඹුර වැඩියෙන් තිබෙන ළිඳට පොදු නමක් හැටියට ඌරු ළිඳ යන වචනය භාවිතයේ පැවතුණා ය යි සිතමි. මේ ළිඳට කඹ පනිට්ටු දැමුවේ ද මුදලාලි ම ය. දිරා කැඩෙන විට අලුතෙන් කඹයක් දැමීම, අලුත් පනිට්ටුවක් දැමීම තමාගේ යුතු කමක් කොට සැලකුවා විය හැකි ය. එහෙමත් ම විටෙක පමණක් ළිඳෙන් වතුර ගන්නා අය මුදල් එකතු කොට කඹයක් පනිට්ටුවක් දැමූ අවස්ථා නැතුවාම නොවේ. දවස පුරා ම ළිඳෙන් වතුර අදින තොරතෝංචියක් නැති කිරිකිරි ශබ්දය අපේ ගෙදරට ද ඇසේ. අහල පහළ ගෙවල් දහයකට පමණ බීමට වතුර ගෙන යන්නේ මෙම ළිඳෙනි.

බොහෝ විට දවසේ සවස් භාගයේ මා සිටින්නේ උඩහ කඩේ පඩි පෙළ මත දෙහි ගහ සෙවනේ වාඩි වී මොනමොනවා හෝ කරමිනි. එක්කෝ තනියම තාක්ක පොළමි. තාක්ක පෙළීම යනු රවුම් තිරිවානා ගල් පහක් උපයෝගී




## නිර්මාණකරුවකුගේ මතක සටහන්

### සනත් පියසේන

කොටගෙන දෙන්නාගේ සිට පස්හය දෙනකුට වුව ද වටේට වාඩිවී ගල් උඩ විසිකරමින්, අල්ලමින් කළ හැකි විනෝද ක්‍රීඩාවකි. නිවසේ දී පිරිස සමග තාක්ක සෙල්ලම් කරන විට ඒ අය පැරදවීමට ඇති හිතේ ආසාව නිසා මා පුහුණුව ලබා ගන්නේ මෙතැන සිට ය. විටෙක මදටිය ගණන් කරමි. තවත් විටෙක ආච්චිට නොකියා දුමෙන් අරන් එන අටු කොස් ඇට සහ අටුකොස් මදුළු විකමින් සිටිමි.

එක දවසක් මෙතැන දී තනියෙන් තාක්ක පොළන විට සූකිරි කෑල්ලක් කෑමට ඇත්නම් යයි සිතී කඩයේ බඩු කිරන ජයරත්න උන්නැහේ ළඟට ගොස් සූකිරි කෑල්ලක් ඉල්ලා සිටියෙමි. මා සූකිරි ඉල්ලූ විටක කිසිම දවසක නොදී සිට නැත. මුදලාලි සිටින විටෙක නම් ඉල්ලන්නට කලින් ම සමහර දාට මට සූකිරි කෑල්ලක් දෙයි.

"අර ඇතුළෙ ගෝනියක තීනව. ගිහින් අරගනින්." සීනි ගොටුවකට සීනි දමමින් සිටි ජයරත්න උන්නැහේ පැවසී ය. මම ඇතුළට ගියෙමි. රෑ බෝ වන්නට ළඟ නිසා ඇතුළ තරමක් කළුවර වූවත් සියල්ල හොඳින් පෙනේ. බිත්තියට හේත්තු කළ සූකිරි ගෝනිය හොඳින් පෙනේ. " බුදු අම්මෝ මෙච්චර සූකිරි" මගේ පෙරේතකම නළියන්නට විය. මම සූකිරි ගෝනිය අසලට ගියා ම නොව එතැනට වීසි වීමි. මා සූකිරි අහුරක් ගෙන මිට මොළවා ගන්නවාත් සමගම සූකිරි ගෝන-යට ගෝනි දෙකකට පමණ එහායින් තිබූ වෙනත් ගෝනියක පිටු පස සිට හොල්මනක් මතු විය. මහතය. බොහෝ මිටි ය. ගෝනියට වඩා උස නැත. කළු පාට ය. අතේ මන්නා පිහියකි. උගුර කාරා ඔරවා ගෙන මා වෙතට පැන්නේ ය. ගල්ලෙන පන්සලේ බිත්තියේ ඉහළින් සිටින යක්ෂයා සිහිවිය. අපි පන්සලේ දී එම පින්තූරය ළඟින් යන්නේ බිමට හරවා ගත් නෙත් වලින් හොරැහින් බලමිනි. අද ඒ යකා උඩහ කඩයේ ය. "ජයරත්න අයි " මට ඊට වඩා කෑ ගසන්නට ඉඩක් නොලැබිණි. හොල්මන මන්නා පිහිය පැත්තකින් දමා මගේ බෙල්ලෙන් අල්ලා ගෙන කට වසා ගත්තේ ය. මා දැඟලුව ද ඉන් පලක් නොවී ය. ගොරවමින්, විටෙක වියරුව සිනා සෙමින් යකා මා තල්ලු කරගෙන කඩය ඉදිරියට ගෙනාවේ ද කට වසා ගත් විදියට ම ය.

"මෙන්න අද හොරෙක් අල්ල ගත්ත" කියමින් ඔහු මා මුදලාලි අසල ට තල්ලු කළේ හයියෙන් හිනාවෙමිනි. මට ඇහුණේ එය යක්ෂ හිනාවක් ලෙස ය. ඔහු තල්ලු කළේ හෙමින් වුවද පොඩි මා ඒ වේගය අනුව මුදලාලි ගේ ඇගේ වැදී නැවතිණි. මුදලාලි මගේ අතින් අල්ලා ගත්තේය.

"මොනවද ගත්තේ?" මුදලාලි ඇසුවේ සැර කරමිනි.

"සූකිරි සේරුවක් විතර අරගත්තෙ නැතෑ. එතකොට ම මං අල්ල ගත්ත." ගොරහැඩි පෙනුමක් ඇති මිටි ම මිටි මනුස්සයා මා දෙස හිනැහෙමින් කීවේ ය. මම හොරැහින් ඔහු දෙස බැලුවෙමි.

කඩේ ජයරත්න, ධර්මදාස බාප්පා,

රොබෝසිංඤෝ මාමා, සුබෝ ආච්චි, මැයිආච්චි ආදී කීපදෙනෙක් ම මා දෙස බලාගෙන ය.

"පියසේනො. කොච්චර ගත්තද බොල සූකිරි? " මුදලාලි සැරෙන් ඇසුවද එහි හිනාවක් ද කලවම් වී ඇත.

"චුට්ටයි."

"හා හා හොඳයි හොඳයි ගිහින් කාපන්කො" මුදලාලි මා අත ඇරියේ ය. මම මූණ අත් දෙකෙන් වසාගෙන පඩි පෙළ දෙසට යන විට හැම දෙනා ම උස් හඬින් සිනාසුණි.

ගෙදරට දුවගෙන ගොස් මිදුලේ දී සූකිරි කැටයක් කටට දමා ගත්තේ දැඩි කෑදර කමිනි. කටට දැනුණේ වෙනදා කන සූකිරි රසය නොවේ. මම තුඃ තුඃ ගා කෙළ ගැසුවෙමි. ඒ සූකිරි නොවේ. මා සූකිරි යයි රැවටී අහුරක් ගෙන තිබෙන්නේ ලුණු ය. කවුදෝ පිටි පස්සෙන් සිට මහා හයියෙන් හිනා වූයෙන් මම ගැස්සී හැරී බැලුවේ බියෙනි. උඩහකඩේ බඩු කිරන කොල්ලා මගේ පිටිපස්සෙන් ම පැමිණ ඇත.

"රැවටිච්චි පොල්කිච්චි සූකිරිකිරි ලුණු කාපි" කියමින් ඔහු උඩහ කඩේ පැත්තට ආපහු හැරී දිව්වේ ය.

මා රවටා විනෝද වීමට කඩේ පිරිස කතා කර අටවාපු උගුලක හිර වී ඇති බව දැන ගත්තේ ඊට පසුව දා ය. මිටියට මහතට හිටි යකා උඩහ කඩේ ඉස්කෝලේ හාමිනේගේ මල්ලී වන කෙනෙකි. ඔහු ඉතාමත් මිටි කුරු අයෙකි. පසුව ඔහු අප සැමගේ ම ඉතා හිතවතෙකු විය. විහිළු කිරීමට රුසියෙකි. දේශපාලන කතා වලටත් දක්ෂ ය. පත්තරේ මුල සිට අග දක්වාම කියවයි. පත්තරය කියවන විට කියවන්නේ හිටගෙන ය. ඔහු පත්තරය දිග හැර ගත් විට පිටතින් බැලුවාට ඔහු ව පෙනෙන්නේ නැත. ගමේ අපි හැමෝ ම ඔහු හැඳින් වූයේ "කොට උන්නැහේ" යන නමිනි. හිතේ පැලපදියම් වී ඇති තවත් සුවිශේෂ පුද්ගලයකු වන ඔහු සමහරක් දාට කඩයට පැමිණ දින කීපයක් නතර වී සිටියි. රබර් කඩේ වැඩට උදපදව් වෙන ඔහු, රබර් ෂීට් තේරීමේ දී ඔසවා බලන සමහර රබර් ෂීට් වලටත් වඩා මිටි ය. ඒ දින දෙක තුනට හෝ ඔහු ගමේ සෑම කෙනෙක් සමගම ඉතාමත් කුළුපගව සිටියි. කළුපාට කුරුලෑ සහිත මුහුණක් ඇති ඔහු වැඩි වශයෙන් සිටින්නේ සිනා සී ගෙන ය. ඉතාමත් චතුර ය. බොහෝ අය සමග දේශපාලනය කතා කරන විට බලා සිටින්නට ආශා හිතෙන තරම් ය. පුංචි අප සමග ඉතාමත් ළෙන්ගතුවෙන් කතා බහ කරන ඔහු සමහර විටක නාරන්බික් ශත දහයක ගෙන අපට බෙදයි. ඔහු උපහාසයට මෙන් නිතර කියන කියුමක් වන "කාපන් බීපන් - පිඟාන ගෙනියන්න එපා" යන වදන අපට එදා නො වැටහුණත් එය කොතරම් හරයක් ඇති වචනයක් දැයි සිතෙන්නේ දැන් ය. "කොට උන්නැහේ ඇවිල්ලා" යන ඉතාමත් ප්‍රිය මනාප පුවත අසන අපි වහාම ඔහු සමග කතා කිරීමේ නො තිත් ආශාවෙන් උඩහ කඩේට දුව ගෙන යන්නෙමු.